# සුසාන මණ්ඩලය හෙවත් අන්තර්පාලන අධිකාරිය

අවුරුදු ගණනාවක් තිස්සේ බටහිරයන්ගේ චින්තනය, දැනුම, ක්‍රම උපක්‍රම පිළිබඳ හදාරා ඇති අයකු ලෙස ඔවුන් කරන කියන දෑ හා ඒ හේතුවෙන් අපටත් අප වැනි රටවලටත් විඳින්නට සිදු වී ඇති දුක පිළිබඳ මට ඇත්තේ වේදනාවකි. වයස අවුරුදු දහහතරක් පමණ වන තුරු ඉවෙන්, සසර පුරුද්දෙන් හා ගෙදර පරිසරයෙන් ඉංගිරිසි ආකල්ප ප්‍රතික්ෂෙපකිරීමට මම දැනසිටියෙමි. ඉන්පසු බටහිර ගණිතය හා බටහිර භෞතික විද්‍යාව ක්‍රමවත්ව හැදෑරීම හේතුවෙන් (එකල ඒ වයසේ දරුවන්ට ද ඒ විෂය ක්‍රමවත්ව හැදෑරීමේ අවස්ථාව විය) බටහිර දැනුම හා චින්තනය ක්‍රම ක්‍රමයෙන් හැඳිනගැනීමට හැකිවිය. (එවකට චින්තනය යනු කුමක්දැයි නොදැන සිටියෙමි. ජාතියක, ගෝත්‍රයක සංස්කෘතිය, දැනුම, කලා ශිල්ප, විද්‍යාව, ආහාර, ආකල්ප, සිරිත් විරිත් ආදී මිනිස් නිර්මාන එකට බැඳ තබන යම් දෙයක් වේද ඒ චින්තනය යැයි නිර්වචනය කිරීමට මා පෙළඹුණේ ඊට බොහෝ කලකට පසු බටහිර ම දාර්ශනිකයකු වූ කූන් පඬිවරයාගේ සුසමාදර්ශනය - පැරඩයිම - යන සංකල්පය ග්‍රහණය කරගැනීමෙන් පසුව ය. චින්තනය යනු සිතීම නොවන බවත් ඒ වචනයෙන් ගුණදාස අමරසේකර මහතා පරිවර්තනය කර ඇති ආකාරයට රුසියන් පඬිවරයකු වූ වැලකි, තෝට් යන ඉංගිරිසි වචනයෙන් අදහස්කරන දෙයක් මෙහි දී ගම්‍ය නොවන බවත් වටහාගත යුතු ය.) වාසනාවකට හෝ අවාසනාවකට හෝ බටහිර ගණිතයට හා බටහිර ගණිතමය භෞතික විද්‍යාවට මම ප්‍රියකෙළෙමි. ඒ හේතුවෙන් නොබෝ කලකින් ම බටහිර චින්තනය හා ඒ සමග බැඳුණු ඇරිස්ටෝටලීය න්‍යාය (ලොජික්) මගේ ආත්මය බඳුවිය. එහෙත් අපේ රටවල මිනිසුන්ට විඳින්නට සිදු වී ඇති දුක නැතිකර ගැනීමට මාර්ගයක් අවශ්‍ය විය. බටහිර චින්තනයෙහි ගිළුණු අයකු ලෙස ඒ සඳහා මා දුටුවේ මාක්ස්වාදය ය. ඉනුදු වඩාත් බුද්ධිගෝචර ප්‍රවණතාව වූ ට්‍රොට්ස්කිවාදය ය. එහෙත් ඒ සියල්ල පුස්සක් බව මට පසක්කරදුන්නේ වික්‍රමබාහු කරුණාරත්න මහතා ය. ඒ පිළිබඳ ඔහුට පින් අත්වෙයි. ඒ මීට අවුරුදු විසිපහකට පමණ පෙර ය. මා නව සමසමාජ පක්ෂයෙන් ඉවත්වූයේ අසූවේ වැඩවර්ජනයට පෙර බව මෙහි ලා වාර්තා කළයුත්තේ ඒ වැරදි අර්ථකථනයන්ට භාජනය විය හැකි බැවින් ය.

එදා මෙදා තුර බොහෝ දෑ සිදු වී ඇත. ජාතියක ජීවිතයෙන් අවුරුදු විසිපහක් යනු සුළු කාලයකි. එහෙත් පුද්ගලයකුගේ ජීවිතයෙන් අවුරුදු විසිපහක් යනු දිර්ඝ කාලයකි. මේ කාලය තුළ මගේ දෙමව්පියෝ අභාවප්‍රාප්ත වූහ. මම සීයා කෙනෙක් වීමි. තව නොබෝ කලකින් මා ද මිය යනු ඇත. එහෙත් ජාතිය ද එලෙස මිය යා යුතු ද? ලෝකයේ ක්‍රිස්තියානි නොවන සංස්කෘතීන් සියල්ල මිය යා යුතු ද? සදහට ම ලෝකයේ ඉතිරි විය යුත්තේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය පමණක් ද? කිසිවක් සදාකාලික නොවන බව දන්නා සිංහල බෞද්ධයනට ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් සිනහසීමට හැකි ය.

නොබෝ කලකින් මිය යන්නේ කායික ව ජීවත්වන පුරුෂයා ය. ඒ කයෙහි ජීවත් වූ බටහිර චින්තනය ආත්මය කරගත් මිනිසා මියගොස් අවුරුදු විස්සකට වඩා වැඩි මිස අඩු නො වෙයි. මා විසින් මගේ ලෝකය නම් කෘතිය පළකෙරුණේ 1986 බිනර මසෙහි ය. ඒ කෘතියෙන් කියැවුණේ අර පුද්ගලයා මියගිය බව ය. ගුණදාස අමරසේකර මහතා ජාතික චින්තනය යන වචනය පළමුවරට යොදා ගත්තේ 1986 අගෝස්තු මස ය. ඒ වැලකි රුසියාව ගැන කී දෙයක් ලංකාවට ආදේශකිරීම සඳහා ලිවීමට ය. මගේ ලෝකය පළමු මුද්‍රණයෙහි චින්තනය යන වචනය සඳහන් නො වෙයි. එහෙත් කල් යෑමේ දී චින්තනය යන වචනය යොදාගැණුනා පමණක් නොව ඒ සංකල්පයක් ලෙස ද වර්ධනය කරනු ලැබිණි. අමරසේකර මහතා 1986 දෙසැම්බරයේ දී රුවන්පුර කලාකවයේ ආරාධනයෙන් පවත්වන ලද කතාවක දී "අප කැමති වුණත් අකමැති වුණත් අපට තෝරාගැනීමට ඇති එකම දේශපාලන දර්ශනය මාක්ස්වාදයයි" කීවේ ය. අද අපට නම් ඒ ස්ථාවරයෙන් මුළුමනින් ම මිදීමට හැකි වී තිබේ.

ලෝක චාරිත්‍රයට අනුව සීයා කෙනකුට සරිලන හැට වියක් ගෙවුණ ද, මගේ ලෝකයේ සඳහන් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය සමග නැවත උපන් පුද්ගලයකු ලෙස මම තවමත් තරුණ වියෙහි පසුවෙමි. ශාරීරික වශයෙන් තරුණ ජවයක් නැති වුව ද මානසික වශයෙන් තරුණ ජවය ක්‍රමයෙන් වැඩෙමින් පවතියි. එබැවින් බටහිරයන්ගේ හොර උපක්‍රම එළිරවුකිරීමට තව තවත් ශක්තිය ලැබෙයි. බටහිර නූතනත්වය යනු ක්‍රිස්තියානි නූතනත්වයක් බව අපි දැන් දනිමු. මේ නූතනත්වයේ ප්‍රධාන ලක්ෂණ අතර වෙන්කිරීම, පුද්ගලිකත්වය, ඉන්ද්‍රිය පිනවීමට රුකුල්දීම හා ඒ වර්ධනයකිරීම, පුද්ගල අයිතිය හා වියුක්ත ව සිතීම වන බව අපි අද දනිමු. ධනවාදය ද බටහිර යටත්විජිතවාදය ද

© Prof. Nalin De Silva

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵල වෙයි. සුනාමිය බෙදවාචකයක් වූයේ අපට ය. එය බටහිරයන්ට බෙදවාචකයක් නො වී ය. ඔවුන්ට ඒ දෙවියන් විසින් කරන ලද ආශිර්වාදයක් විය. බටහිරයන්ට අවශ්‍යවන්නේ මුළු ලෝකය ම ආගමින් බැරිනම් සංස්කෘතියෙන් ක්‍රිස්තියානි කිරීම ය. ලෝකයේ  වසන සියල්ලන් තම ආගමට හරවන ලෙස ක්‍රිස්තුස් වහන්සේ කියා ඇත. ක්‍රිස්තියානි භක්තියකු යනු ක්‍රිස්තුස් වහන්සේට අනුව ජීවත්වන්නෙකි. ආගමික නිදහස නමින් බටහිරින් එන මිෂනාරිවරුන්ට ක්‍රිස්තියානි ආගමට හැරවීමේ නිදහස ඇතැයි ඇතැම්හු තර්කකරති. මේ තර්කවල පදනම පුද්ගලික නිදහස ඊනියා මානව අයිතිවාසිකම් ආදිය එකම මූලයකින් ගලා එන දේ බව අපි අද දනිමු. ඒ බව අප දන්නේ පසුගිය අවුරුදු විස්සක පමණ කාලයක අප විසින් නිර්මානයකෙරුණු දැනුම හේතුකොටගෙන ය. එපමණක් නොව මාක්ස්වාදය ද බටහිර චින්තනයේ පසුගාමී කොටසක් බව අපි දනිමු. මේ පිළිබඳ වැඩි විස්තරයක් තවමත් අප අතින් ලියැවී නැත. එක් අතකින් බලනකල මාක්ස්වාදය හා කතෝලික පල්ලිය අද ඉටුකරන්නේ එකම කර්තව්‍යයකි. දේශපාලන බලයක් නොමැති මේ ආයතන දෙක අද ඉටුකරන්නේ බටහිර (කතෝලික නොවන) ක්‍රිස්තියානි සංස්කෘතිය පැතිරවීමට ආධාරකිරීම පමණකි. මාක්ස්වාදයේ කතෝලික චින්තනය ද අඩංගුවන බව පැහැදිලි ය. මාක්ස්වාදය යුදෙව් කතෝලික චින්තනය මත පදනම්වන අතර බටහිර නූතනත්වය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වෙයි. බටහිර චින්තනයේ පසුගාමී කොටස් වූ මාක්ස්වාදයටවත්, පශ්චාත් මාක්ස්වාදයටවත්, ඊනියා පශ්චාත් නූතනවාදයටවත්, බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව අද ඇඟිල්ලක්වත් සෙලවීමට නො හැකි ය. අද ඒවාට ඇඟිල්ලක් හෝ සෙලවිය හැක්කේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සහාය දීමට පමණකි. පසුගිය දා බෞද්ධ පාසලක පාංශුකූල පිංකමකට ද සහභාගි කරවාගත් පාප්තුමා ස්වර්ගස්ථවීමට පෙර පෝලන්තය මාක්ස්වාදයෙන් මුදවාගැනීමටත් ඒ ඔස්සේ නැගෙනහිර යුරෝපයේ මාක්ස්වාදී රාජ්‍ය නැතිකිරීමටත් කටයුතු කළ බව අපි දනීමු. එතුමා එලෙස සේවය කෙළේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට මිස කතෝලික පල්ලියට නොවන බව අර පාංශුකූල පිංකමට සහභාගි වූ භික්ෂූන් වහන්සේලා නොදැන සිටියාට පේදුරුතුමා දැන සිටියේ නම් ප්‍රශ්න මතුවීමට තිබුණි.

සුනාමිය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට දේවාශිර්වාදයක් වී ඇත්තේ ඊනියා පුනරුත්ථාපනය සඳහා දෙන ආධාර මගින් අපේ රටවල් මත තව තවත් දේශපාලන බලපෑම්කිරීමට ඉන් අවස්ථාව ලැබෙන බැවින් ය. එක් පැත්තකින් සුනාමි කඳවුරුවල ක්‍රිස්තියානි ආගම පැතිරවීමට පැමිණි මිෂනාරිවරු හා මිෂනාරිනියෝ වූහ. අනෙක් පැත්තෙන් වඩාත් භයානක සොල්හයිම් නඩය විය. සොල්හයිම් නඩය අද තමන්ට අවශ්‍ය කටයුතු බොහොමයක් කර අවසාන ය. සුනාමි හෙවත් සුසාන ලියැවිල්ල විශ්ලේෂණයකර එහි ඇති භයානක තත්ත්වය තේරුම්කර දීම ඉතාමත් සුළු කාර්යයකි. සුනාමි මණ්ඩලවල සංයුතිය ද , එහි කාර්යභාරය ද මුළුමනින් ම සිංහලයන්ට විරුද්ධව සැකසී ඇත. මේ කර ඇත්තේ උතුරු හා නැගෙනහිර පළාතේ ප්‍රදේශ කිහිපයක් සඳහා අන්තර්වාර ස්වයං පාලන අධිකාරයක් පිහිටුවීම ය. ඒ පැහැදිලිවම ස්වයං පාලන අධිකාරියකි. ඒ වගකියන්නේ කිනම් ආයතනයකට ද?  අඩුතරමින් භාණ්ඩාගාරයට හා පාර්ලිමේන්තුවට ඒ වග නොකියයි. සුසාන මණ්ඩලයකට විරුද්ධව ජනතාවට යා හැකි අධිකරණයක් වේ ද? එයට විරුද්ධව නීති සම්පාදනය කිරීමට පාර්ලිමේන්තුවට නො හැකි ය. ඒ පාර්ලිමේන්තුව විසින් පිහිටුවන ලද ආයතනයක් නොවන බව අමතක නොකළ යුතු ය. යම්තමින් හෝ එහි සඳහන්වන්නේ ඊනියා ජාත්‍යන්තර ඒජන්සි ගැන ය. නාමික ලංකාණ්ඩුව, කොටි සංවිධානය හා ජාත්‍යන්තර කලවැද්දන්, එනම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි නියෝජිතයන් එක් වී මණ්ඩලවල සංයුතියෙහි, ඒ බලපාන කාලයෙහි, ඒ වලංගුවන ප්‍රදොශවල යම් යම් සංශෝධන ඇතිකළ හැකි ය. ඒ අනුව යථාකාලයේ දී සොල්හයිම් නඩය , තමිල්සෙල්වම් කල්ලිය හා ආණ්ඩුව නමින් ක්‍රියාත්මකවන නරිනාටකය එකතු වී කාලය අවුරුද්දකට වඩා වැඩිකරන අතර භූමි ප්‍රදේශය ද මුළු මහත් උතුරු හා නැගෙනහිර පළාත් ද සමහරවිට භූමිය වශයෙන් එයටත් එහාට යන ප්‍රදේශ ද එක්කෙරෙන්නක් බවට පත්කරනු ඇත. එපමණක් නොව  2 (ඊ) වගන්තියට අනුව  ඉහත කී ත්‍රිදෝෂ හෙවත් සිංහල විරෝධී තුන් කට්ටුවට එකතු වී මුහුදු ප්‍රදේශ හා වරාය සඳහා ද සුසාන මණ්ඩලය වලංගු කරනු ඇත. එවිට ඒ මණ්ඩලය අන්තර් පාලන අධිකාරිය මිස අන්කිසිවක් නො වෙයි. මෙහි දී මෙරට සිටින විවිධ ක්‍රිස්තියානි පල්ලි මණ්ඩලයට සහාය දෙනු ඇත. ඒ එම ව්‍යාපෘතිය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අනුකූල බැවින් ය. කතෝලික පල්ලියේ හා මාක්ස්වාදී පල්ලියේ පූජකවරුන්ට ද තම පැවැත්ම ඇත්තේ ක්‍රිස්තියානි නූතනත්වයට දෙන ආධාරය මත හෙයින් එයට ආවැඩීමට සිදුවෙයි. (මේ ලිපිය මාස තුනකට උඩ දී අපෙන් වෙන්ව ගිය මෑණියන්ට පින් පිණිස ය)

© Prof. Nalin De Silva